# රට ආර්ථික ව්‍යසනයක මුවවිට

චන්ද්‍රා ජයරත්න



උතුරේ පැවැති යුද්ධයේ අවසන් භාගයේ සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් ප්‍රකාශයට පත්ව ඇති ප්‍රධාන කතන්දර දෙකකි. එකක් යුද්ධය පිළිබඳ රජයෙන් කියන කතාවය. අනෙක ඒ යුද්ධය පිළිබඳවම එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය කියන කතාවය.

රජය පවසන පරිදි යුද්ධයේ අවසන් භාගයේ ක්‍රියාත්මක කර ඇත්තේ කොටුවී සිටි ජනතාව මුදාගැනීම සඳහා වන මානුෂීය මෙහෙයුමකි. එහිදී යුද වැදුණු පාර්ශ්ව දෙකේ සාමාජිකයන් හැර කිසිදු සිවිල් පුද්ගලයකු මරණයට පත්ව නොමැත.
යුද්ධයේ අවසන් අදියරේ සිදුවූ සිදුවීම් පිළිබඳ සොයා බැලීමට එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් පත්කළ විමර්ශණ කණ්ඩායම කියන පරිදි රජයේ ප්‍රකාශයය අසත්‍යයකි. යුද්ධයේ අවසන් භාගයේදී 40,000ක් ජීවිතක්ෂයට පත්ව තිබේ. ඒ හැරුණු විට තවත් යුද අපරාධ සිදුව තිබේ.

ඒ අතර පසුගියදා මාර්ග ආයතනය මගින් එළිදක්වන ලද ග්‍රන්ථයකින් තුන්වන කතන්දරයක් ද ඉදිරිපත් කිරීමට යෙදුණි. දෙපාර්ශ්වය අතර සංහිඳියාවක් ඇති කිරීමට නම් ඇත්ත සොයා යා යුතු බව කියැවෙන එම කතන්දරයේදී ප්‍රකාශ වන්නේ වෙනත් මානයකි. යුද්ධයේ අවසන් අදියර ගැන රජය කියන කතාව මෙන්ම එක්සත් ජාතීන් කියන කතාව ද එමගින් බැහැර කෙරේ.
මේ ආකාරයෙන්ම එකිනෙකට වෙනස් සංඛ්‍යා ඉදිරිපත් කරමින් ඩයස්පෝරාව ඇතුළු තවත් පාර්ශ්ව විසින් ඉදිරිපත් කරන වෙනත් කතන්දර කීපයක් ද ඇති නමුත් ප්‍රධාන වශයෙන් සැළකිල්ලට බදුන්වන්නේ රජයෙන් කියන කතාවත් එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයෙන් කියන කතාවත්ය. මාර්ග ආයතනය පසුගියදා ඉදිරිපත් කළ තුන්වන කතන්දරය තවමත් සමාජය තුළ ප්‍රමාණවත් කතිකාවකට ලක්ව නොමැත.
පුද්ගලික අංශයේ ව්‍යවසායකත්වය තුළ අපට මේ අවස්ථාවේදී වඩා වැදගත් වන්නේ මේ විවිධ කතිකාවන් හෝ එමගින් ඉදිරිපත් කෙරෙන විවිධාකාර සංඛ්‍යා සහ තර්ක විතර්ක නොවේ. මේ සියල්ලේ අවසන් ප්‍රතිඵලය වනු ඇත්තේ කවරක් ද යන්නය. රටේ අනාගතය තීරණය වන්නේ ඒ මත බැවිනි.

මේ සියළු කතිකාවල අරමුණ ලංකාවේ සිටින සියළු පුරුවැසියන්ගේ අනාගතය යහපත් කිරීම බව ඒ ඒ පාර්ශ්ව වෙතින් ප්‍රකාශිතය. එසේ නම් අප වඩාත් අවධානය යොමුකළ යුත්තේ දීර්ඝ කාලීන සංවර්ධනයක් තුළින් සියල්ලන්ගේ සංවර්ධනයක් ඇති කිරීමයි. ඒ සඳහා ප්‍රමුඛතම අවශ්‍යතාව වන්නේ රට තුළ සංහිඳියාවක් ඇතිවීමය.

යුද්ධයේ අවසන් අදියරේ ඇතිවූ තත්ත්වය සම්බන්ධයෙන් වන ඉහත දැක්වුණු එකම කතන්දරයක් මගින් හෝ ඒ අරමුණ ඉටුකර ගත හැකිවේ ද යන්න විමසා බැලිය යුතුය. දැන් පවතින්නේ ප්‍රමුඛ කතන්දරකරුවන් දෙදෙනා දෙපිළ බෙදී වෙන් වෙන් වශයෙන් සත්‍ය ගවේශණය කිරීමකි. එක් අතෙකින් එක්සත් ජාතීන් යුද්ධයේ අවසන් සමයේ සිදුවූ ඝාතන පිළිබඳ තොරතුරු සොයන අතර අනෙක් පසින් ප්‍රමාදවී හෝ ශ්‍රී ලංකා රජයත් මැක්ස්වල් පරණගම කොමිසම මගින් ඒ කටයුත්තම වඩාත් පුළුල්ව සිදුකිරීම අරඹා තිබේ. මේ සියළු දෙනා කටයුතු කරන ආකාරයෙන් පෙනී යන්නේ එහි අවසානය දීර්ඝ කාලීන සංහිඳියාවක් ඇති කිරීමේ අරමුණ ව්‍යර්ථ කරනු ඇති බවයි.

කවර තත්ත්වයක් යටතේ හෝ වේවා මේ දෙපාර්ශ්වය සිදුකරගෙන යන පරීක්ෂණ කටයුතු නිමාවීමට අඩුතරමින් තවත් වසරක්වත් ගත වනු ඇත. එහිදී අප අතින් වරදක් සිදුව නැතැයි හෙළිදරව් වුවහොත් ගැටළුව එතැනින් අවසන් වනු ඇත. එහෙත් එසේ නොවී අප අතින් වරදක් සිදුව ඇති බව හෙළිවුවහොත් ඒ සම්බන්ධයෙන් වන ඉදිරි කටයුතු සඳහා තවත් කාලයක් ගත වනු ඇත. එය වසරක් දෙකක් හෝ හෝ වඩාත් දීර්ඝ කාලයක් වුව ද විය හැකිය. ඇතැම් රටවල මෙ-වැනි කාරණා අරභයා පැවැති නඩු කටයුතු අවසන්ව තීන්දු ලැබී ඇත්තේ වසර විස්සක් තිහක් වැනි දීර්ඝ කාලයකට පසුවය. ඒ වන විට ඒවාට සම්බන්ධ පාර්ශ්වකරුවන් බොහෝ දෙනෙකු මියගොස්ය. එසේ නොමැති නම් බොහෝ සෙයින් වයස්ගතය.

මේ කවර ආකාරයකින් කටයුතු අවසන් අදියරක් කරා පැමිණිය ද එමගින් රට තුළ සංහිඳියාවක් ඇතිවේදැයි යන්න ප්‍රශ්ණයකි. 'වරද කළ අයට දඬුවම් කරමු' යන



සටහන
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

ජාත්‍යන්තරයේ ප්‍රතිපත්තිය මගින් ලංකාවේ නම් කිසිවෙකුට හෝ කිසිම ආකාරයක යහපතක් සිදු නොවනු ඇත. අනෙක් අතට රජය ජාත්‍යන්තරය නොසළකමින්, ජාත්‍යන්තර පරීක්ෂණයට අවහිර කරමින් තමන්ට අවශ්‍ය ආකාරයට පරීක්ෂණ පවත්වමින් සංහිඳියාව සොයා යන ගමනෙන් ද රටට කවර ආකාරයක හෝ ලාභයක් අත්වේ යැයි කිව නොහැකිය.

මේ යන අයුරින් තවදුරටත් රටට කවරාකාරයේ ඉදිරි ගමනක යෙදෙන්නට හැකිවනු ඇතිදැයි අපි විමසා බැලිය යුතුය. මගේ අවධානය යොමුවන්නේ එහිදී ආර්ථිකමය වශයෙන් අපට මුහුණ දීමට සිදුවිය හැකි ව්‍යසන පිළිබඳවය. අප අභිමුව ඇති එවැනි ව්‍යසන රාශියක් මට පෙනෙයි.

## අවදානම් සහගත තත්ත්වය

හැත්තෑව දශකය ආරම්භයේදී අප රටට විශාල විදෙස් විනිමය හිඟයකට මුහුණ පෑමට සිදුව තිබිණ. එවක සියළු ආනයනයන් සඳහා පළමු පන්තියේ යුරෝපීය බැංකුවක අනුමැතිය ලබාගැනීම අප රටට අනිවාර්ය විය. එවැනි තත්ත්වයකට නැවත වරක් නුදුරේදීම අප රටට මුහුණ දීමට සිදුවිය හැක. එවැනි තත්ත්වයක් ඇතිවීමට යුද්ධය සම්බන්ධයෙන් දැනට කෙරීගෙන යන ජාත්‍යන්තර පරීක්ෂණ අවසන්වීමේ අවශ්‍යතාවයක් පැන නගින්නේ නැත. එම පරීක්ෂණ මගින් අප වැරදිකරුවන් බවට පත්වනු ඇතැයි අන්තර්ජාතික ප්‍රජාවට සාධාරණ සැකයක් ඇතිවුවහොත් එකී කොන්දේසි පැනවිය හැකිය. එවැනි තත්ත්වයකදී විදෙස් ගනුදෙනු සඳහා අපේ රටේ බැංකුවලින් ලබාදෙන අනුමැතියක් ප්‍රමාණවත් නොවනු ඇත.
රටක අවදානම් සහගත තත්ත්වය එනම් සෘසින චරුපසමප එක වැඩි වන විට එය රටේ සියළු මුල්‍ය සබඳතා කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකිරීම වැළැක්විය නොහැක. අපේ රටට එවැනි රිස්ක් ප්‍රීමියම් එකක් ඇත. ලන්ඩන් ඉන්ටර් බෑන්ක් ලෙන්ඩින් රේට් එක එනම් එංගලන්තයේ ප්‍රාථමික බැංකුවකට ණය දෙන පොලී අනුපාතය 1%නම් ලංකාවට ණය දෙන්නේ 6%ක පමණ වන පොලී අනුපාතිකයකටය. රිස්ක් ප්‍රීමියම් යනු ඒ වෙනසයි. අපට ඇති අනාගත අවදානම හමුවේ මේ රිස්ක් ප්‍රීමියම් එක 8%ක් හෝ 9%ක් දක්වා ඉහළ ගියහොත් ආනයන සඳහා අපට ගෙවන්නට සිදුවන මුදල අධික වේ. එහි ප්‍රතිපලයක් ලෙස භාණ්ඩ මිල ඉහළ යාම, උද්ධමනය වැඩිවීම ආදිය සිදුවිය හැකිය.

අප රටට දැනටමත් මුහුණ දීමට සිදුව ඇති කාරණයක් මෙසේය. පසුගිය දිනවල රජය ඉදිරිපත් කළ ණය අයදුම් ගිවිසුම් දෙකකදීම ජාත්‍යන්තරයෙන් ණය ආරක්ෂණ කොන්දේසි ඉදිරිපත් කර තිබිණ. මේවා හැඳින්වෙන්නේ 'සැන්ෂස් ක්ලෝසස්' වශයෙනි. එය එක්තරා ආකාරයක ණය ආරක්ෂණයකදී ඉදිරිපත් කෙරෙන කොන්දේසි දැමීමකි. පසුගිය කාලයේ ඉරානය දකුණු අප්‍රිකාව ආදී රටවලට දමා තිබුණු මෙම සැන්ෂස් ක්ලෝසස් මේ වන විට යුක්රේන අර්බුදය හේතුවෙන් රුසියාවට දමා තිබේ. දැන් අපටත් එම තත්ත්වයටම මුහුණ පෑමට සිදුව තිබේ. ඉදිරියේදී ජාත්‍යන්තරව යම් වාරණයක් සිදුවුවහොත් මේ ණය ගිවිසුමේ කොන්දේසි අවලංගු වන බව එමගින් කියැවේ. එවිට ඇතිවන තත්ත්වයට අනුව ඇතිකර ගත් ගිවිසුම් අහෝසිවීම යාම හෝ නව කොන්දේසි මත නැවත ඇතිකරගැනීමට එකඟවීමට අපට සිදුවනු ඇත.

ලබන වසරේ මාර්තු මාසය වන තෙක් ජාත්‍යන්තර පරීක්ෂණයෙන් යුද අපරාධ සම්බන්ධයෙන් අප රටට අදාළව ලැබෙන තීරණය පිළිබඳ නිගමනයකට ඒම දුෂ්කරය. ඒ දුෂ්කරතාවය පවා අපගේ මුල්‍ය කළමණාකරණය කෙරෙහි නරක බලපෑම් ඇතිකරනු නොවැළැක්විය හැකිය. ඒ කාලය තුළ රටේ අනාගතය සහ මුල්‍ය තත්ත්වයේ ස්ථාවරත්වයක් පිළිබඳ ඇතිවන සැකය හේතුවෙන් ආයෝජන පහත වැටීමේ අවදානමක් ඇත.

## ආර්ථික වර්ධන වේගය

අපගේ ආර්ථික වර්ධනය 8%ක වර්ධන වේගයකින් පවත්වාගෙන යාම රජයේ අරමුණ බව කියැවේ. එවැන්නක් කිරීමට නම් ජාතික නිෂ්පාදනයෙන් 35%ක පමණ ඉතිරි කිරීමක් අවශ්‍ය වේ. දැනට රට තුළ පවතින එම අගය 26% ක් පමණ වේ. ඉතිරිය සොයාගැනීමට වන්නේ පිටරටවලින් එන ප්‍රාග්ධනය මගිනි. මෙවැනි අවස්ථාවකදී ප්‍රාග්ධනය අපේක්ෂිත මට්ටමකින් නොලැබීම නිසා අපගේ ආර්ථිකයේ වර්ධන වේගයත් සැළකිය යුතු අකාරයකින් පහත වැටීමට ඉඩ ඇත.

රජයේ තක්සේරුව වන්නේ දැනට ඩොලර් බිලියන 60ක් පමණ වන අපගේ ස්ටොක් චේන්ජ් එක මේ වසර අවසානය වන විට ඩොලර් බිලියන 100ක් වනු ඇති බවය. ඉන් පසු එය නැවතත් දෙගුණ තෙගුණ වනු ඇති බවය. එසේ වන්නට නම් රට තුළ යහපත් වාතාවරණයක් තිබිය යුතුය. පවතින අවදානම් තත්ත්වය හමුවේ විදෙස් ආයෝජන වැඩිවේ ද නොඑසේව සිදුකර ඇති ආයෝජන ද නැවත කැඳවනු ඇති ද යන්න ගැටළු සහගතය. යම් ප්‍රශ්ණකාරී තත්ත්වයක් ඇතිවුවහොත් නව ආයෝජන කෙසේ වෙතත් මෙහි සිදුකර ඇති ආයෝජන ද අහිමිවීමට ඉඩ ඇත.

## ලොකුම අවදානම

මේ සියල්ල අතරේ ඇති ලොකුම අවදානම මෙයයි. මහ බැංකුව පවසන පරිදි අපගේ විදේශ විනිමය ඉතිරිය ඩොලර් බිලියන 10 කි. මේ බිලයන 10 සැදී ඇත්තේ අප ණයට ගත් මුදල් ද ඇතුළත්වය. රජයේ සෘණපත්, බොන්ඩ් සහ භාණ්ඩාගාර බිල්පත් වලින් බිලියන 7 කි. එය සම්පූර්ණයෙන්ම ණයකි. අවදානම වැඩිවන බව පෙනෙන එක සංඥාවක් මගින් මේ සියල්ල සෙකන්ඩරි මාකට් එකේ විකිනීමට ඉඩ ඇත. එසේ මේ බිලියන 7 ඉවත් වුව හොත් අප බරපතල විදේශ විනිමය හිඟකමකට මුහුණ පෑමට සිදුවනු ඇත.

යුද්ධය නිමාවීමෙන් පසු රට තුළ ආගම්වාදී ප්‍රචණ්ඩ ක්‍රියා හිස එසවීමේ ප්‍රවණතාවක් පවතී. මෙතෙක් කල් මේ රටේ ජාතීන් අතර පැවැති ප්‍රශ්නයට අමතරව දැන් ආගමික ප්‍රශ්නයක් ද මතුව ඇති බව අන්තර් ජාතික පරීක්ෂණ වාර්තාව මගින් අනාවරණය කරනු ලැබුවහොත් ඇතිවන තත්ත්වය තවත් බරපතල වනු ඇත. රාවණා බලය, බොදු බලය ආදී පිරිස් විසින් කරනු ලබන ක්‍රියා හේතුවෙන් මේ රටේ සුළු ආගමික කොටස් වෙත පීඩා සිදුවන බව දැනටමත් අන්තර් ජාතික වශයෙන් අවධානයට ලක්ව තිබේ. පරීක්ෂණ වාර්තාව මගින් ඒ බව තවදුරටත් තහවුරු කළ හොත් ඉස්ලාම් ආගමික රටවල් අප රට කෙරෙහි මෙතෙක් දක්වා ඇති යහපත් ප්‍රතිචාරය තවදුරටත් ඒ ආකාරයෙන්ම පවතිනු ඇතැයි සිතීම අපහසුය. අපගේ ආර්ථිකයේ ප්‍රබල පුරුක වන්නේ පිටරට රැකියා නියුක්තියෙන් ලැබෙන බිලියන හතයි දශම පහක විදේශ විනිමය ආදායමයි. මැදපෙරදිග රැකියා අහිමි කිරීමක් මගින් මේ විදේශ විනිමය අහිමි වුවහොත් අපට ආනයන කටයුතු සිදුකිරීමට නොහැකි තත්ත්වයක් උදාවිය හැකිය.

යුද අපරාධ චෝදනා තහවුරුවුව හොත්
අන්තර් ජාතික වාර්තාව මගින් යුද්ධයේ අවසන් අදියරේදී යුද අපරාධ සහ සමූල ඝාතන සිදුව ඇති බව ප්‍රකාශ වුවහොත් තත්ත්වය තවදුරටත් බරපතල වනු ඇත. එවැනි තත්ත්වයකදී අවදානම් කලමණාකරුවෝ සෘසින ජ්බැටැරි අපට විරුද්ධව වාර්තා ලියනු ඇත. එවිට අපට අන්තර්ජාතික වශයෙන් විවිධ විරෝධතාවලට මුහුණ පෑමට සිදුවිය හැකිය. ලංකාවෙන් යැවෙන භාණ්ඩ මිලදී නොගැනීම වැනි තත්ත්ව පමණක් නොව අපේ භාණ්ඩ පිටරටවලදී ගොඩබෑම පවා ප්‍රතික්ෂේප කරන තත්ත්වයන් ඇතිවිය හැකිය. මීට පෙර ද එවැනි තත්වයන් ඇතිවූ අවස්ථා ඇත. මේ සියල්ල රටේ ආර්ථිකයට නරක අයුරින් බලපානු ඇත.



38 වන පිටට